# පරිසර කළමනාකරණය පිළිබඳව බුදුසමයාගත ආකල්පය: සේනාසනක්ඛන්ධකය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*පූජ්‍ය මීරිගම සමිත චන්ද්‍ර හිමි* [1]

මෙම පර්යේෂණ පත්‍රිකාවේ ගැටළුව වන්නේ පරිසර කළමනාකරණ සංකල්පය පිළිබඳව බුදුදහමේ ආකල්පය සේනාසනක්ඛන්ධකය ඇසුරින් විමර්ශනයක් සිදු කිරීමයි. එමෙන්ම එහි භාවිතය ප්‍රායෝගිකව නූතන ලෝකය තුළ යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ ලෙස දැක්විය හැකිය. ඒ පිළිබඳව බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනය මගින් තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. මානව ශාස්ත්‍ර හා සම්බන්ධව වන ගුණාත්මක පර්යේෂණයක් වන මෙහි තුලනාත්මක විධික්‍රමවේදය හා අවස්ථානුකූලව තාර්කික විශ්ලේෂණය භාවිත කෙරේ. කළමනාකරණයෙන් ධ්වනිත වන්නේ කිරීම හා කරවීම මෙන්ම කළයුතු සුදුසු දේ මනාව සිදුකිරීමයි. පරිසරය යන වචනය සංකීර්ණ අරුත් දෙන පදයකි. එසේම එය ඒ ඒ විෂයට සාපේක්ෂව අරුත් ගන්වයි. සමස්තයක් ලෙස පරිසරය යනු මිනිසුන් සතුන් ගහකොල ඇතුළු ජීවමය වස්තූන්ය. ස්වාභාවික ලෝකය, ආලෝකය හා ආහාර වැනි භෞතික වස්තූන් කෙරෙහි බලපෑම් ඇතිකරවන සියලු ආකාරයේ බාහිර සාධකයන් ද ඇතුළත්වේ. පුද්ගලයන් සත්ත්වයන් වටා පවත්නා සහ ඔවුන්ගේ ජීවන රටාව කෙරෙහි බලපෑම් ඇතිකරවන අප වටා ඇති සියලු තත්ත්වයන් ද ඊට අන්තර්ගත කළ හැකිය. එම පරිසරය මනා අවබෝධයකින් පරිභෝජනය කිරීම හා සුරක්ෂිත කිරීම පරිසර කළමනාකරණය කිරීමයි. බෞද්ධ මූලාශ්‍රයාගත කරුණු අනුව පරිසර කළමනාකරණය යන්න පුද්ගලයාට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුත්තකි. එමෙන්ම මානව අයිතිවාසිකම් සුරැකීමක් බවට ද එය පත්වේ. නූතන ලෝකයේ පරිසර කළමනාකරණයට අදාළ න්‍යායන් හා භාවිතයන් පිළිබඳව බෞද්ධ මූලශ්‍රයයන්හි දැක්වෙන බෞද්ධ පරිසර කළමනාකරණ සංකල්පයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ සාකච්ඡා කිරීම මෙහි දී සිදුව ඇත. එහෙයින් නූතන ලෝකයේ පරිසර කළමනාකරණ විෂයෙහි ඇති වී තිබෙන ගැටළු හා එම ගැටළු අවම කරගැනීමට කෙතරම් දුරකට බෞද්ධ මූලාශ්‍රයාගත කරුණු උපයෝගි වන්නේ ද යන්න අධ්‍යයනය කිරීම සිදු කරනු ලබයි. මේ අනුව අවසන් වශයෙන් නිගමනය කළ හැක්කේ සේනාසනක්ඛන්ධකයෙහි ඇති පරිසර කළමනාකරණය පිළිබඳ තොරතුරු නූතන ලෝකයේ ඇති පාරිසරික ගැටළු අවබෝධ කරගැනීමට හා අවම කරගැනීමට භාවිත කළ හැකි බවයි.

***ප්‍රමුඛ පද:*** පරිසර කළමනාකරණය, නූතන භාවිතය, ප්‍රායෝගිකත්වය, බුදුදහම

[1] බෞද්ධ සංස්කෘතික අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
mirigamasamitha483@gmail.com